## දෙවන වාර පරීක්ෂණය - 2018
## කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර
### ව්‍යවසායකත්ව අධ්‍යයනය - 1 පත්‍රය
### 11 ශ්‍රේණිය

නම:- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . කාලය පැය 01

❖ නිවැරදි පිළිතුර තෝරන්න.

01. 'ව්‍යවසායකත්වය ' සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය නම්,

1. නිෂ්පාදන ක්‍රියාවලියට යොමු කිරීමේ හැකියාව
2. නිවැරදි තීරණ ඔස්සේ ආර්ථික හා සමාජීය වශයෙන් වෙනසක් සිදු කරන්නෙකි.
3. පවත්නා අදහස් සංකල්ප එලෙසම ක්‍රියාත්මක කරන්නෙකි.
4. සම්පත් මනා ලෙස කළමනාකරන්නෙකි.

02. ගැටළු හා අවස්ථාවන් හඳුනාගෙන ඒවාට විසඳුම් ලෙස නව අදහස් හා නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව

1. නවෝත්පාදනයකි.
2. අනාගත දැකීමයි.
3. නිර්මානශීලීත්වයයි.
4. ස්වාධීනත්වයයි.

03. විද්‍යුත් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම,

1. නව සොයා ගැනීමකි.
2. දිගුවකි.
3. සංකලනයකි.
4. අනුකරණයකි.

04. පාරිසරික වෙනස්වීම් අනුව ඔවුන්ගේ ගමන් මග වෙනස් කිරීම

1. නම්‍යශීලීත්වයයි
2. නිර්මාණ ශීලීත්වයයි.
3. ස්වයං පෙළඹවීමයි.
4. ආත්ම විශ්වාසයයි.

05. ව්‍යාපාරයක් සාර්ථක වීමට බලපාන එක් කරුණක් වන්නේ,

1. අවදානම් නුනි කිරීම
2. සම්පත් භාවිත කිරීම
3. පැවැත්ම ගැන සිතීම
4. අරමුණක් පැවතීම

06. ඩෙංගු මර්දනය සඳහා ලංකාවේ ක්‍රියාත්මක වන වැඩසටහන් හඳුන්වා දීම

1. අභ්‍යන්තර ව්‍යවසායකයෝය.
2. ව්‍යාපාර ව්‍යවසායකයෝය.
3. සාමාජීය ව්‍යවසායකයෝය.
4. ලාභ ලබන ව්‍යාපාරිකයෝය.

07. ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභයකි.

1. නව භාණ්ඩ හා සේවා වෙළෙඳපළට ඉදිරිපත් කිරීම.
2. ව්‍යවසායකයා ප්‍රමාණවත් ලාභයන් ලැබීම.
3. විදේශ විනිමය ඉපයීම.
4. නව නිපයුමක් හඳුන්වා දීම.

08. අපේ රටේ කුඩා පරිමාන ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි.

1. ගනුදෙනු සටහන් කිරීම
2. බාහිර පරිසරයේ ඇතිවන වෙනස්කම් හඳුනා ගැනීම හා අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම
3. ව්‍යාපාරික කටයුතු සැලසුම් සහගත කිරීම
4. ව්‍යාපාරික සම්පත් පාලනය කිරීම

09. සේවකයින්ට වැඩ පැවරීමට සහ පෙළඹවීමට ඇති හැකියාව
1. තාක්ෂණික කුසලතාවයයි 2. මානව කුසලතාවයයි
3. සංකල්පනාත්මක කුසලතාවයයි 4. සන්නිවේදන කුසලතාවයයි

10. ඩිජිටල් කැමරා භාවිතය නිසා ඡායාරූප ශාලාවල අවශ්‍යතාව අඩුවීම.
1. ආර්ථික පරිසරයේ බලපෑමකි.
2. භෞතික පරිසරයේ බලපෑමකි.
3. විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරයේ බලපෑමකි.
4. ස්වභාවික පරිසරයේ බලපෑමකි.

11. ශ්‍රී ලංකාවේ මානව සම්පතෙහි පවතින සුවිශේෂී තත්ත්වයක් නම්,
1. සම්පත් නිර්මාණශීලීව සොයා ගැනීම.
2. අනෙකුත් රටවලට වඩා මානව සම්පත් බහුල වීම.
3. සම්පත් නම්‍ය හා නිර්මාණශීලීව යොදා ගැනීම
4. සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතීම.

12. ව්‍යාපාර අදහස් , ව්‍යාපාර අවස්ථාවකින් වෙනස් වන්නේ,
1. ව්‍යාපාර අදහස් සුලභ නැති අතර ව්‍යාපාර අවස්ථා සුලභය.
2. ව්‍යාපාර අදහසක් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකි අතර ව්‍යාපාර අවස්ථාව ක්‍රියාවට නැංවිය හැකිය.
3. ව්‍යාපාර අදහස් විවෘත නැති අතර ව්‍යාපාර අවස්ථා විවෘතයි.
4. ව්‍යාපාර අදහස් විශාල වශයෙන් ජනනය නොවන අතර ව්‍යාපාර අදහස් ජනනය වේ.

13. සූක්ෂම විශ්ලේෂණය සඳහා භාවිතා කල හැකි නිර්ණායක ඇතුලත් කාණ්ඩය නම්,
1. වෙළෙඳපලක් පැවතීම හා අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගත හැකි වීම.
2. නීතිරීති වලට අනුකූල වීම හා තරගකාරිත්වය.
3. ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවය.
4. ව්‍යවසායකයාගේ හැකියාව හා ලැදියාව.

14. ශුද්ධ අත විශ්ලේෂණයේ බාහිර පරිසරයෙහි දක්නට ලැබෙන අවස්ථාවක් වන්නේ,
1. තරගකරුවන් ඉවත් වීම 2. සම්පත් පැවතීම.
3. දක්ෂ සේවකයින් සිටීම. 4. මූල්‍ය ස්ථාවරත්වය.

15. පේටන්ට් බලපත්‍රයක් වලංගු කාලය,
1. අවු. 10 2. අවු. 15 3. අවු. 20 4. අවු. 21

16. ව්‍යාපාරයක අපේක්ෂිත අරමුණු හා ඒ සඳහා ක්‍රියාත්මක විය යුතු විවිධ කාර්යයන් ඇතුලත් ලේඛනය නම් කරනුයේ
1. විධායක සාරාංශය. 2. ක්‍රියාත්මක සැලැස්ම.
3. ව්‍යාපාර සැලැස්ම 4. පරිපාලන සැලැස්ම.

17. ව්‍යාපාර සැලැස්මෙහි ව්‍යාපාරයක මුදල් ගලා ඒම් සහ ගලා යාම් ඇතුලත් සැලැස්ම වන්නේ,
1. මූල්‍ය සැලැස්ම. 2. අලෙවි සැලැස්ම
3. පරිපාලන සැලැස්ම 4. නිෂ්පාදන සැලැස්ම

18. ව්‍යාපාර සැලැස්මක ඇස්තමේන්තුගත කාර්යාල සේවක වැටුප් ඇතුලත් සැලැස්ම වන්නේ,
1. මූල්‍ය සැලැස්ම. 2. අලෙවි සැලැස්ම
3. පරිපාලන සැලැස්ම 4. නිෂ්පාදන සැලැස්ම

19 ව්‍යාපාරයක සැලැස්මක එක් අවශ්‍යතාවක් වනුයේ,
1. ව්‍යාපාරයේ අලෙවි පුරෝකතනයක් කිරීම
2. ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීම
3. අමුද්‍රව්‍ය අවශ්‍යතාව හඳුන්වා දීම.
4. ව්‍යාපාරයේ ස්වභාවය හඳුන්වා දීම.

20. සමස්ත ව්‍යාපාර සැලැස්මේ පදනම අලෙවි සැලැස්මයි. ඉලක්ක වෙළඳපල, පාරිභෝගිකයින්, තරගකරුවන්ගේ ස්වභාවය අලෙවිකරණ උපක්‍රම පිළිබඳ ගැඹුරින් සොයා බැලීමක් සිදුවන්නේ,
1. විකුණුම් පුරෝකථනයෙන් 2. අලෙවි සැලැස්මෙන්
3. වෙළඳපල විශ්ලේෂණයෙන් 4. ව්‍යාපාර සැලැස්මෙන්

21. පාරිභෝගිකයාගේ අවශ්‍යතා හා වුවමනා ඉටුකර දීමට වෙළඳ පලට ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව හඳුන්වනු ලබන්නේ,
1. නිෂ්පාදනය 2. නිෂ්පාදිතය
3. ඉලක්ක ගත භාණ්ඩයන් 4. ආදේශකයන්.

22. ව්‍යාපාරයක අලෙවි ස්ථාවර වත්කම් හා නිෂ්පාදන ස්ථාවර වත්කම් අඩංගු ප්‍රකාශය තෝරන්න.
1. වාහන ක්ෂය, වාහන අළුත්වැඩියා වියදම්, වාහන නඩත්තු වියදම්.
2. රථ ක්ෂය, රථ රක්ෂණය, ඉන්ධන වියදම
3. ත්‍රී රෝද රථය, රථ වාහන, ගොඩනැගිලි,
4. රථ වාහන ස්ටිකර්, ගෙන ඒමේ කුලී, ගෙන යාමේ කුලී.

රන්දුනි මල්පෝච්චි නිෂ්පාදන ආයතනය මසකට මල් පෝච්චි 8000 ක් නිෂ්පාදනය කරයි.

| | |
|---|---|
| සිමෙන්ති මැ 50 එකක් | රු. 1000 |
| වැලි කියුබ් එකක් | රු. 6000 |
| ජලය | රු. 2000 |
| විදුලිය | රු. 3000 |
| පුහුණු ශ්‍රමිකයන්ගේ මාසික වැටුප | රු. 20000 |
| නූ පුහුණු ශ්‍රමිකයන්ගේ මාසික වැටුප | රු. 8000 |

23. මෙම නිෂ්පාදන ආයතනයේ මල් පෝච්චි 1 ක මිල කීයද?
1. රු. 9. 00 2. රු. 10. 00 3. රු. 11. 25 4. රු. 12. 00

24. මෙම ආයතනයේ මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?
1. රු. 79000 2. රු. 90000 3. රු. 80000 4. රු. 85000

25. පරිපාලන සැලැස්මක ඇතුලත්වන එක් කරුණක් වන්නේ,
1. සේවක වැටුප් හා වේතන
2. ද්‍රව්‍ය ද්‍රව්‍ය පිරිවැය
3. ශ්‍රමය හා ශ්‍රම පිරිවැය
4. නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය.

26. අලෙවි කළමනාකරුගේ කාර්යයක් වන්නේ,
1. නිෂ්පාදන කටයුතු මෙහෙයවීම
2. ප්‍රවර්ධන ඉසව් සංවිධානය
3. දෛනික ගනුදෙනු සටහන් කිරීම
4. සේවකයින්ගේ ලිපිගොනු නඩත්තු කිරීම

27. ප්‍රධාන කළමනාකාරිනියගේ වගකීම විය යුත්තේ,
   1. ප්‍රමිතියට අනුව නිෂ්පාදනය
   2. නිෂ්පාදන ඉලක්ක සපුරාලීම
   3. කාර්යක්ෂමව නිෂ්පාදන, අලෙවි හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
   4. නිෂ්පාදන ඉලක්ක සපුරාලීමට වගබලා ගැනීම

28. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දරන වියදමක් ලෙස නම් කල හැක්කේ,
   1. සැපයුම්කරුවන් සමග තොරතුරු හුවමාරු කිරීම සඳහා රු. 1000 ක් ගෙවීම.
   2. බලපත්‍ර සඳහා ප්‍රාදේශීය සභාවට ගෙව්වා රු. 1500
   3. කාර්යාලයට ලී බඩු මිලදී ගත්තා රු. 60000
   4. වෙළෙඳ පල සමීක්ෂණය සඳහා NS සමාගමට රු. 20000 ක් ගෙව්වා

29. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. අයිතිකරුවන්, සේවකයින්, තරගකරුවන්.
   2. තරගකරුවන්, සේවකයින්, සැපයුම්කරුවන්
   3. සේවකයින්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්
   4. අයිතිකරුවන්, සේවකයින් කළමනාකරුවන්

30. නිශ්චිත කාලච්ඡේදයක් තුල ව්‍යාපාරයේ මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් අතර වෙනස එම කාලච්ඡේදයේ අවසාන දිනට ඇති ශේෂය හඳුන්වන්නේ,

| | |
|---|---|
| 1. මුදල් ශේෂය | 2. බැංකු ශේෂය |
| 3. අතිරික්තය | 4. ඌනතාවය |

31. ව්‍යාපාරිකයාගේ ඉලක්ක වෙළෙඳ පල කොටස ඇතුලත් සැලසුම වන්නේ,

| | |
|---|---|
| 1. අලෙවි සැලැස්ම | 2. පරිපාලන සැලැස්ම |
| 3. නිෂ්පාදන සැලැස්ම | 4. මූල්‍ය සැලැස්ම |

32. ව්‍යාපාරයක ස්ථාවර වත්කම් ලෙස හැඳින්විය හැක්කේ,

| | |
|---|---|
| 1. බඩුතොගය | 2. ණය හිමියෝ |
| 3. කාර්යාලීය උපකරණ | 4. මුදල් ශේෂය |

33. ජංගම ගිණුමේ ඇති මුදල් ශේෂය ඉක්මවා චෙක්පත් ලිවීම නම් කරන්නේ,

| | |
|---|---|
| 1. වෙළෙඳ ණයකි. | 2. බැංකු අයිරාවක් |
| 3. ජංගම ගිණුම් ශේෂයකි | 4. කෙටිකාලීන ණයකි. |

34. වෙළෙඳ ණය ගැතියන් යනු,

| | |
|---|---|
| 1. ජංගම වත්කමකි. | 2. ජංගම වගකීමකි. |
| 3. ජංගම නොවන වත්මකි | 4. ජංගම නොවන වගකීමකි. |

35. නිෂ්පාදන නොවන පිරිවැයක් ලෙස නම් කල හැක්කේ,

| | |
|---|---|
| 1. ශ්‍රම පිරිවැය | 2. පරිපාලන වියදම් |
| 3. අමුද්‍රව්‍ය පිරිවැය | 4. පුරස්කාර පිරිවැය |

පහත සිද්ධිය කියවා අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පානදුර ප්‍රදේශයේ පදිංචි සමීර පානදුර ප්‍රදේශයේ පාසල්වලට අවශ්‍ය ටයිපටි මැසීම හා නිලලාංජන සකස් කිරීම ව්‍යාපාරයක් ලෙස කරගෙන යයි. මේ සඳහා රු. 500000/- බැංකුණයක් ද ලබා ගත්තේය. රු. 1500/- ලියාපදිංචි ගාස්තුවක් ද, ඔහු දැරිය. මාර්තු මාසය තුල ටයිපටි මැසීමට රෙදි මිලදී ගැනීමට රු. 150000 ක් ද, ටයිපටි මසන්නන්ට වැටුප් ලෙස දෙදෙනාට රු. 15000 බැගින් වැටුප් ගෙවීය., විදුලි බිල සඳහා රු. 1500 ක් වැය විය. ජුකි මැෂින් 6 ක් , එකක් රු. 60000 බැගින් වැය කර මිලදී ගන්නා ලදී.

36. සමීරගේ ව්‍යාපාරයේ ඉලක්ක වෙළඳ පළ වන්නේ,

1. පානදුර ප්‍රදේශයේ පාසල්
2. පාසල් ශිෂ්‍යයින්
3. ප්‍රාථමික පාසල් ශිෂ්‍යයින්
4. ද්විතියික පාසල් ශිෂ්‍යයින්

37. මෙම ව්‍යාපාරයේ නිෂ්පාදන නොවන පිරිවැය වල වටිනාකම

1. රු. 30000
2. රු. 31000
3. රු. 31500
4. 32000

38. මුළු ස්ථාවර වත්කම් වල වටිනාකම,

1. රු. 290000
2. රු. 60000
3. රු. 60000
4. රු. 360000

39. විවිධ කුසලතා සහිත කළමනාකරුවන් බඳවා ගැනීම සංවිධානයට,

1. දුර්වලතාවයකි
2. අවස්ථාවකි.
3. ශක්තියකි
4. තර්ජනයකි

40. මෙම ව්‍යාපාරයේ මුදල් ගලා ඒමක් වන්නේ,

1. ජුකි මැෂින් මිලදී ගැනීම
2. විදුලි වියදම දැරීම
3. බැංකු ණය ලබා ගැනීම
4. රෙදි මිලදී ගැනීම